# මෞර්ය වංසය

එළාර රජුට අනුරාධපුරයෙහි යම් පිරිසක් සහාය දක්වා ඇති බව පැහැදිලි ය. අවුරුදු හතළිස්හතරක් එක දිගට රජකිරීමට ඔහුට හැකිවුයේ කෙසේ ද යන්න ද නොවිසඳුනු ප්‍රශ්නයකි. ඔහු දකුණු දඹිදිවෙන් පැමිණියේ නම් ඔහුගේ රාජ්‍යය හා රාජධානිය කවරක් වී ද? එළාර රජුට සහාය දැක්වූ පිරිස කවු ද? ඔවුන් අතර නන්දිමිත්‍ර සෙනෙවියාගේ මාමා වූ මිත්‍ර සෙනෙවියා ද වූ බව පැවසෙයි. එළාර රජුට කලින් මෙහි පැමිණියේ යැයි කියන සේන හා ගුත්තික කවු ද? ඔවුන් පැමිණියේ කොහි සිට ද? අශ්ව වෙළෙඳුන් දෙදෙනකුට අනුරාධපුර රාජධානිය පහසුවෙන් පැහැර ගැනීමට හැකි වූයේ කෙසේ ද?

පණ්ඩුකාභය රජතුමා ලංකාව එක්සේසත් කළ ද යක්ෂයන් හා අර්ධ වෛදිකයන් අතර වූ ගැටුම නිමාවට පත්විණි යැයි සිතිය නො හැකි ය. යක්ෂ ගෝත්‍රිකයෝ විවිධ පළාත්වල විසිරී සිටියහ. අනුරාධපුරයේ රිටිගල ප්‍රදේශයේ ද වෙනත් තැන්වල ද, මහවැලි ගඟ අවට ප්‍රදේශවල ද ඔවුහු වාසය කළහ. එයට අමතරව ඔවුන් තවත් ප්‍රදේශවල ජීවත්වන්නට ඇත. පණ්ඩුකාභය රජතුමාගෙන් අවුරුදු දහස්ගණනකට පසුව ද මෑතක්වන තුරුම යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් යම් පිරිසක් තම අනන්‍යතාව ආරක්ෂාකර ගැනීමට වෙහෙස වූහ. තවමත් තමන් යක්ෂ ගෝත්‍රිකයන් යැයි කියන ඒ අනන්‍යතාව ගැන ආඩම්වර වන පිරිස් සුළුවෙන් නමුත් සිංහලයන් අතර වෙති.

මහසෙන් රජු දවස යක්ෂගෝත්‍රිකයන් තරමක් බලවත් වූ බව පෙනී යයි. අපේ ඉතිහාසය හදාරන්නන් මහායානික සබඳතා ගැන අවධානය යොමු කළත් යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් වූ බලපෑම් ගැන නොහැදෑරීම කණගාටුවට කරුණකි. ලම්බකර්ණික රජ පෙළපත පිළිබඳ තවමත් සැලකිය යුතු යමක් කීමට ඉතිහාසඥයන්ට නො හැකි ය. වසභ රජුගෙන් ලම්බකර්ණ රජ පෙළපත ආරම්භ වූ බව කීව ද සුභ රජු ගැන යමක් නො කියැවෙයි. සුභ දොරටුපාලකයකු පමණක් ලෙසින් අපට ඉදිරිපත් කෙරෙයි.

යසලාලක තිස්ස රජු හා සුභ අතර ඇති වූ ගැටුම හුදු විහිළුවකට ලඝු කිරීමට වඩා විහිළුවක් තවත් තිබිය නො හැකි යැයි කෙනකුට කිව හැකි ය. එහෙත් එය භයානක විහිළුවක් වන්නේ එයින් ඉතිහාසය විකෘත වන බැවිනි. සුභ රජවීමෙන් පසුව තමන්ට විරුද්ධ වන්නේ යැයි කී වසභ කෙනකු ගැන සෙවීමට පටන්ගත් බවත් ඒ වසභ සුභ රජුගේ නෑයකු බවත් කියැවෙයි. සුභ රජු ලම්බකර්ණ ගෝත්‍රයට අයත්වී යැයි සිතීමට ඉතිහාසඥයන් මැළිකමක් දක්වන්නේ ඇයි ද යන ප්‍රශ්නය වෙයි. සුභ දොරටුපාලකයකු ලෙස ඉදිරිපත් කළ විගස අපට සිතට එන්නේ වත්මන් ආරක්ෂක භටයකු ය. එහෙත් එකල දොරටුපාලකයා යනු වැදගත් නිලයක් දැරූ තැනැත්තෙක් විය.

බ්‍රිතානි ආණ්ඩුව යටතේ ද ගේට් මුඩලියර්ලා සිටියහ. එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ පියා ද ගේට් මුඩලියර්වරයෙකි. එකල බ්‍රිතානි ආණ්ඩුව යටතේ ලාංකිකයකුට දැරිය හැකි උසස් ම තනතුර වූයේ ගේට් මුඩලියර් නිලය ය. අවශ්‍ය නම් ගේට් මුඩලියර් යන්න දොරටුපාලක ලෙස පරිවර්තනය කළ හැකි යැයි සිතමි. ගේට්ටුවේ හෙවත් දොරටුවේ මුදලි නැත්නම් දොරටුව භාරව සිටි මුදලි වැනි අදහසක් ගේට් මුඩලියර් යන්නෙන් ලැබෙයි.

මෙරට මෞර්ය යනුවෙන් රජ පෙළපතක් පාරම්පරිකව මුල සිට ම තිබී ද යන්න ද ප්‍රශ්නයකි. ධාතුසේන රජු මෞර්ය වාංශික රජකු යැයි කියැවෙයි. පැහැදිලිව ම මෞර්ය යන්න අශෝක රජතුමාගේ රාජ වංශය අනුව මෙහි නිර්මාණය කරන ලද්දක් විය යුතු ය. ගැමුණු රජතුමා හෝ වළගම්බා රජතුමා හෝ මෞර්ය වංශයට අයත් බවක් සඳහන් නො වෙයි. එහෙත් කලකට පසු මෞර්ය රාජ වංශයක් මෙරට ඇති වී තිබෙන බව පැහැදිලි ය.

මෞර්ය රාජ වංශය අශෝක රජුට නෑකමක් නැති වුව ද ඒ රාජ වංශය කවුරුන් විසින් ඇති කෙරුණ ද ඒ නම රාජ වංශයට දෙන්නට ඇත්තේ අර්ධ වෛදිකයන් බව පැහැදිලි ය. පණ්ඩුකාභය රජු ද අර්ධ වෛදිකයෙකි. ඔහු විසින් කරන ලද්දේ යක්ෂ ගෝත්‍රිකයන් යම් ප්‍රමාණයක් සමග එකතු වී අර්ධ වෛදික තම මාමාවරුන් බහුතරයක් නසා සිංහල ජාතිය නිර්මාණය කිරීමට පසුබිම සකස් කිරීම ය. ඒ සිංහල ජාතියට අර්ධ වෛදිකයන් ද, යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් යම් පිරිසක් ද වැදි ගෝත්‍රය හැරෙන්නට වෙනත් ගෝත්‍ර ද එකතු වී ඇති බව පෙනෙයි.

වැදි ගෝත්‍රය තම සංස්කෘතිය හා ජීවනෝපාය වෙනස්කර ගැනීමකින් තොරව සිංහල ජාතියෙන් බාහිර ව ජීවත් වී ඇති අතර යක්ෂ ගෝත්‍රිකයන් විශාල ප්‍රමාණයක් සිංහලයන් සමග ගැටෙමින් තම අනන්‍යතාව රැකගනිමින් ජීවත් වී ඇත. යක්ෂ ගෝත්‍රිකයන් ද වැදි ගෝත්‍රිකයන් මෙන් නොව එහෙත් අර්ධ වෛදිකයන් මෙන් ගොවිතැන තම

© Prof. Nalin De Silva

ජීවනෝපාය කර ගනිමින් ජීවත් වූ පිරිසකි. දඹදිවින් පැමිණි අර්ධ වෛදිකයන් ගංගාශ්‍රිත සංස්කෘතියක් නිර්මාණය කිරීමට වෙහෙසෙද්දී (මල්වතු ඔය හා රුහුණේ ගංගා හා ඔය) යක්ෂ ගෝත්‍රිකයන් යම් පිරිසක් වැව් කර්මාන්තයෙහි නිරත වී ඇත. පඬු අබා කුමරු සැඟවුණු ගස් බෙණය තිබූ වැව අර්ධ වෛදිකයන් වැව් තැනීමේ තාක්ෂණය ඉගෙනීමට පෙර යක්ෂ ගෝත්‍රිකයන් විසින් කරන ලද්දක් බව පැහැදිලි ය.

පඬු අබා විසින් පිහිටුවන ලද සිංහල රාජ්‍යයට යක්ෂ ගෝත්‍රිකයන් යම් ප්‍රමාණයක් මුල්දී ම විරුද්ධ වන්නට ඇත. පඬු අබා රජුගේ සිට ගැමුණු රජ කාලය දක්වා ඒ ඒ රජවරුන්ගේ රාජ්‍ය කාල පිළිබඳ වංසකතාවල දැක්වෙන තොරතුරු පිළිබඳ සැක මතුවෙයි. පඬු අබා රජු ම සැත්තෑ වසරක් රජ කළ බව සඳහන් වෙයි. යමකුට සැත්තෑ වසරක් රජකිරීම නොහැකි කරුණක් නොවුණ ද ඒ පිළිගැනීමේ යම් ගැටලු මතුවෙයි.

වංසකතාවල කුමක් සඳහන් වුව ද පඬු අබා රජුගේ සිට ගැමුණු රජු දක්වා අර්ධ වෛදික රාජ වංසයක් එක් දිගට අඛණ්ඩව රාජ්‍ය පාලනයෙහි යෙදුණේ ද යන්න ප්‍රශ්නයක් වෙයි. වංසකතාවලට අනුව ගැමුණු කුමරුගේ පෙළපත ද අනුරාධපුරයෙන් රුහුණට පළාගිය පඬු අබා පෙළපතේ ශාඛාවක් වෙයි. එහෙත් ඒ එලෙස ම සිදු වී ද යන ප්‍රශ්නය පැන නගී. වංසකතාවල කෙසේ හෝ ගැටගසා ඉදිරිපත් කරන එකම රජ පෙළපතේ කතාව විශ්වාස කිරීම තරමක් අපහසු ය. කාවන්තිස්ස රජු හා විහාර මහා දේවිය රුහුණේ පදිංචි වූ වෙනත් අර්ධ වෛදික පෙළපත්වලට අයත් වූවන් ලෙස සැලකීමට ඇති ඉඩකඩ වැඩි ය.

එමෙන් ම අර්ධ වෛදිකයන්ට පඬු අබා රජුගේ සිට එළාර රජු රජවන තෙක් අඛණ්ඩව අනුරාධපුරය පාලනය කිරීමට හැකි වී ද යන්න ද ප්‍රශ්නයකි. අඩුම තරමින් සේන ගුත්තික ප්‍රවෘත්තිය එසේ නොවූ බවට සාක්ෂියකි. සේන ගුත්තිකට පෙර මෙරට යක්ෂ ගෝත්‍රිකයන් කැරලි ගැසූ අවස්ථා ද තිබෙන්නට ඇත. ඔවුන් එළාර රජ වෙන තෙක් තමන්ගේ ම වූ රාජ්‍යයක් අනුරාධපුරයේ නො පිහිටුව ද ඒ ආසන්න ප්‍රදේශවල රාජ්‍ය පවත්වාගෙන යන්නට ඇතැයි සිතිය හැකි ය. එවැනි අවස්ථාවල ඇතැම් විට අනුරාධපුරයේ රජුන් නොමැති අවස්ථා ද තිබෙන්නට ඇත.

වංසකතා අනුරාධපුරයේ එසේ රජවරුන් නොසිටි වකවානු මග හරින්නේ ද? එසේ මග හැරීමට ගොස් පඬු අබා ආදී රජවරුන්ගේ රාජ්‍ය කාල දික් කර ඇත් ද? පඬු අබා රජුගෙන් පසුව යක්ෂ ගෝත්‍රිකයන් ටික කලක් වුවත් අනුරාධපුරය අල්ලා නොගත්තත් එහි අර්ධ වෛදිකයන්ට රජ වීමට අවස්ථාව නො දෙන්නට ඇත. වංසකතාවල එවැනි කාල වෙනත් රජකුට භාර දී ඒ වෙනත් රජුගේ රාජ්‍ය කාලය දික්කර ඇති බව පෙනෙයි. පඬු අබා අනුරාධපුර රජ කෙළේ යැයි කියන අවුරුදු හැත්තෑවෙන් යම් කාලයක් එතුමාගේ මරණින් පසු ක්ෂණිකව හෝ කලකට පසුව හෝ අනුරාධපුරය අරාජික වූ සමයක් විය හැකි ය. ඒ අරාජික සමය පඬු අබා රජුට ම බැරකිරීමට වංසකතා පෙළඹෙන්නට ඇත. එහෙත් මේ පිළිබඳ නිගමනවලට එළඹීමට පෙර තවත් අධ්‍යනය කළ යුතු වෙයි.

සේන ගුත්තික කෙසේ වෙතත් එළාර රජු මෙරට ම යක්ෂ ගෝත්‍රික රජකු විය හැකි ය. එසේත් නැත්නම් දඹදිවින් හෝ පර්සියාවෙන් හෝ පැමිණි යක්ෂ ගෝත්‍රික රජකු විය හැකි ය. මෙරට සිටි යක්ෂ ගෝත්‍රිකයන් අර්ධ වෛදිකයනට විරුද්ධව එළාර රජුට සහාය දෙන්නට ඇතැයි සිතිය හැකි ය. රිටිගල මෙන් ම අනුරාධපුර අවට වෙනත් ප්‍රදේශවලද යක්ෂ ගෝත්‍රියන් එළාර රජුට ආධාර කිරීම හේතුවෙන් පමණක් නොව දිවයිනෙහි වෙනත් ප්‍රදේශවල, විශේෂයෙන් ම මහවැලි ගඟ දිගේ පොළොන්නරුවේ සිට මහියංගනය දක්වා ආසන්න ප්‍රදේශවල (බුදුන් වහන්සේ මහියංගනයේ දී යක්ෂ ගෝත්‍රිකයන්ට දහම් දෙසූ බව ද අමතක නොකළ යුතු ය) යක්ෂ ගෝත්‍රිකයන් ද එතුමාට ආධාර කළ බැවින් අවුරුදු හතළිස්හතරක් රජ කිරීම ප්‍රශ්නයක් වී නැත. මහවැලිය ආසන්නයේ ජීවත් වූ ජනයා මහවැලි ගඟ දිගේ කඳවුරු තිස්දෙකක් බැඳ රුහුණෙන් අනුරාධපුරයට සේනා යෑමට බාධා පමුණුවා ඇති බව පැහැදිලි ය.

ගැමුණු රජුගෙන් පසුව ද විවිධ කාලවල යක්ෂ ගෝත්‍රිකයන්ගේ බලය වැඩි වන්නට ඇත. සිංහල රජවරුන් දුර්වල වූ විට යක්ෂ ගෝත්‍රිකයන් බලවත් වන්නට ඇත. එසේ ම යක්ෂ ගෝත්‍රිකයන් බුද්ධදහම ප්‍රතික්ෂේප කිරීම, භාරතයෙන් ථෙරවාදය අතුරුදහන්වීමට කටයුතු සැලසීම, මහායානික බලපෑම් ආදිය සියල්ල එකතු වූ විට පස්වැනි සියවස වන විට මෙරට සිංහල ථෙරවාද බෞද්ධ රාජ්‍යයට තර්ජන වන්නට ඇත. මෞර්ය රාජ්‍ය වංසය යන්න එවැනි පසුබිමක නිර්මාණය කරගන්නා ලද සංකල්පයක් බව පැහැදිලි ය. සිංහල රජවරුන් අශෝක රජුට ඥාති සම්බන්ධයක් නැති වුවත් ඉහත සඳහන් තර්ජන හමුවෙහි උත්තර භාරතය හෝ පැරණි දඹදිව හෝ සමග තමන්ට තිබූ ආධ්‍යාත්මික සම්බන්ධකම් වර්ණනා කිරීමක් පස්වැනි සියවසේ සිදුවිණි යැයි සිතා ගැනීමට හැකි ය. එකල

© Prof. Nalin De Silva

උත්තර භාරතයෙහි ථෙරවාදයක් නොමැතිවීම ප්‍රශ්නයක් නොවන්නට ඇත්තේ සිංහලයන් භෞතික උපකාරයකට වඩා ආධ්‍යාත්මික උත්තේජනයක් උත්තර භාරතයෙන් බලාපොරොත්තු වූ නිසා විය යුතු ය.

අප මෙහි සඳහන් කරන මතවලට සාක්ෂි වංසකතාවලින් ලබාගත හැකි නො වේ. වංසකත ලියැවී ඇත්තේ ම එවැනි සාක්ෂි තිබිණි නම් ඒ නැතිකිරීමට ය. එහෙත් වංසකතාවල ඇති පරස්පර ඔස්සේ අපට අලුත් ඉතිහාසයක් ගොඩ නැගීමට සිදු වී ඇත. සිංහල රාජවංසයට මෞර්ය නමක් පටබැඳීම මෙන් ම ලම්බකර්ණ වංසයක් නිර්මාණය කිරීම ද එකම කාලයක මෙන් සිදු වී ඇත. අපට මෙහි දී තවත් කරුණක් සිහිවෙයි. දේවානම්පිය තිස්ස රජු බුදු දහම වැළඳ ගැනීම එකකි. එහෙත් එතුමාට මෞර්ය අභිෂේකය ලබාදීම තවත් එකකි. අශෝක රජු තම මිතුරාට තම පෙළපතේ අභිෂේකය ද එවී යැයි ද දේවානම්පිය තිස්ස දේවානම්පිය යන අභිධානය ද සමගින් දෙවැනි වරටත් අභිෂේකය ලබා ගත්තේ යැයි ද වංසකතාවෙහි සඳහන් වෙයි. මේ කතාව ද ගෙතුණේ පස්වැනි සියවසේ පමණ ද? අශෝක රජුට කිසිම නෑකමක් නොතිබූ සිංහල රජවරුන් මෞර්ය පෙළපතක ආධ්‍යාත්මික සාමාජිකයන් බවට පත්කරනු ලැබුයේ මේ අභිෂේකය මගින් ද? එහෙත් වංසකතාවල අසංගත බව හේතුකොටගෙන ගැමුණු ආදී පස්වැනි සියවසින් පෙර සිටි සිංහල රජවරු මෞර්ය වාංශිකයන් ලෙස හඳුන්වනු නො ලැබෙති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva